LCB Finance PLC

අභිමානයේ නව මානය

# මූලික තොරතුරු ලේඛණය



# ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් පී.එල්.සී.

## ප්‍රධාන තොරතුරු පත්‍රිකාව

### මුදල් පිටුබලය සහිත ණය පහසුකම්

විස්තරය: මුදල් පිටුබලය සහිත ණය පහසුකම යනු අප ආයතනයේ ඇති ඔබගේ ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් ශේෂ ආපසු නොගෙන ඔබගේ හදිසි අවශ්‍යතා සඳහා මුදල් ලබා ගැනීමට ඇති හොඳම ක්‍රමයයි.

| නිෂ්පාදනය / සේවාව | ප්‍රතිලාභ දිරිදීමනා / ප්‍රවර්ධනය කිරීම් | පොළිය / ගාස්තු | අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය | ප්‍රධාන අවශ්‍යතා / කොන්දේසි |
|---|---|---|---|---|
| මුදල් පිටුබලය සහිත ණය පහසුකම් | • ඔබ සිටින ස්ථානයට ම පැමිණ ලබා දෙන කඩිනම් සේවාව.<br>• නම්‍යශීලී ආපසු ගෙවීමේ ක්‍රම.<br>• පුහුණු කාර්ය මණ්ඩලය හරහා ගනුදෙනුකරුගේ අවශ්‍යතාවයට අනුව ලබා දෙන සේවාව.<br>• වටිනාකම මත ණය ලබා දීමේ අනුපාතය - ස්ථාවර තැන්පතු අගයෙන් උපරිම 90% දක්වා (කොන්දේසි අදාළ වේ)<br>• ලියවිලි අවශ්‍යතාවය අවම වීම | පොළී අනුපාතිකය තැන්පතුවේ පොළී අනුපාතයට වඩා 3% ක් වැඩි වේ. | 1. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත<br>2. තැන්පතුවේ රිසිට්පත හෝ ඉතුරුම් පාස් පොත භාර දීම<br>3. ජාතික හැඳුනුම්පතේ හෝ ජාතික හැඳුනුම්පත් අංකය සහිත වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්<br>4. තැන්පතුවෙන් ණය හිලව්කර ගැනීම සඳහා අවසරය ලබා දෙන ලිපිය | 1. උකසේ අයිතිය පද්ධතියේ සටහන් කර, රිසිට්පතේ හෝ පාස් පොතේ යෝග්‍ය පරිදි සටහන් කිරීම.<br>2. උපරිම කාලය අවුරුදු 5 යි<br>3. වයස අවුරුදු 18 ට වැඩිවිය යුතු ය. |

**මෙම ලියවිල්ල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2018 අංක 1 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවේ නියමයන්ට අනුකූලව සකස් කර ඇත.**

## නිශ්චල දේපළ ඇපයට තබන ණය පහසුකම් (ව්‍යාපාර හෝ නිවාස ණය)

| නිෂ්පාදනය / සේවාව | ප්‍රතිලාභ දිරිදීමනා / ප්‍රවර්ධනය කිරීම් | පොළිය / ගාස්තු | අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය | ප්‍රධාන අවශ්‍යතා / කොන්දේසි |
|---|---|---|---|---|
| නිවාස ණය<br><br>(සින්නක්කර නිශ්චල දේපළ) | • කඩිනමින් අනුමැතිය සහ මුදල් ලබා දීම<br>• වටිනාකම මත ණය ලබා දීමේ අනුපාතය - දේපළ බලකර විකිණිය හැකි වටිනාකමෙන් උපරිම 70% ක් දක්වා (කොන්දේසි අදාළ වේ)<br>• ගිනි සහ සොරකම් රක්ෂණ ආවරණය (අදාළ වන්නේ නම්) | 1. ආපසු ගෙවීම් අක්‍රමවත් නම් පමණක් වාර්ෂිකව 3% ක අමතර දඩ පොළිය<br><br>2. පොළී අනුපාතය: ක්‍රියාත්මක පොළී අනුපාතය අතීත ගෙවීම් වාර්තාව, ආපසු ගෙවීමේ හැකියාව සහ ඇපය ලෙස උකසට තබන දේපළ අනුව වෙනස් වේ. | 1. අයදුම්කරු ආදායම සහ අපේක්ෂිත ණය පහසුකමේ මාසික වාරික ගෙවීමට ඇති හැකියාව පැහැදිලිව තහවුරු කළ යුතු ය. | 1. හිමිකම් වාර්තාව සමඟ මුල් හිමිකම් ඔප්පුව<br>2. තක්සේරු වාර්තාව (අනුමත කළ තක්සේරුකරුවෙක් විසින් සිදු කළ යුතුය) / දේපළ පරීක්ෂණ වාර්තාව<br>3. මුල් මිනින්දෝරු සැලැස්ම<br>4. පත්ඉරු වාර්තා<br>5. පළාත් පාලන ආයතනයෙන් ලබා ගන්නා වීදි රේඛා , නොපැවරීමේ සහ හිමිකරු සහතික<br>6. අනුමත ණය පත්‍රිකාව<br>7. ණය පිරිනැමීමේ ලිපිය (පිළිගත්)<br>8. ණය ගිවිසුම<br>9. ඉදිකිරීමක් අදාළ වන්නේ නම් අනුමත ගොඩනැගිලි සැලැස්ම<br>10. ප්‍රමාණපත්‍ර<br>11. අනුකූලතා සහතිකය<br>12. ඉදිකිරීමක් අදාළ වන්නේ නම් අනුමත ගොඩනැගිලි සැලැස්ම |
| | • පුහුණු කාර්ය මණ්ඩලය හරහා ගනුදෙනුකරුගේ අවශ්‍යතාවයට අනුව ලබා දෙන සේවාව<br>• වෙළෙඳපොළ අනුපාතවලට සමගාමීව ඉතා තරඟකාරී අනුපාත | 3. ලියවිලි ගාස්තු / පාරීක්ෂා කිරීමේ ගාස්තු / තක්සේරු ගාස්තු / රක්ෂණ ගාස්තු / වරිපනම් සහ බලාත්මක බදු<br><br>4. නීති ගාස්තු සහ මුද්දර ගාස්තුව | 2. අයදුම්කරුගේ සහ කලත්‍රයාගේ ණය තොරතුරු කාර්යාංශ වාර්තාව පදනම් කර ගෙන ණය විනය පිළිබඳ තීරනය කරනු ලැබේ | 13. ප්‍රමාණපත්‍ර<br>14. ඉදිකිරීම් අවසන් වූ පසු අනුකූලතා සහතිකය<br>15. ව්‍යාපාර ආයතන අදාළ වන විට විගණනය කරන ලද ගිණුම්<br>16. ආදායම් බදු විස්තර |

**මෙම ලියවිල්ල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2018 අංක 1 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවේ නියමයන්ට අනුකූලව සකස් කර ඇත.**

# පුද්ගල ඇපකරුවන් මත ලබා දෙන ණය පහසුකම්

| නිෂ්පාදනය / සේවාව | ප්‍රතිලාභ දිරිදීමනා / ප්‍රවර්ධනය කිරීම් | පොළිය / ගාස්තු | අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය | ප්‍රධාන අවශ්‍යතා / කොන්දේසි |
|---|---|---|---|---|
| පුද්ගල ඇපකරුවන් මත ලබා දෙන ණය පහසුකම් (බද්ධ සහ කිහිප දෙනෙක් සඳහා) | කෙටි කාලීන ණය<br><br>වේගවත් අනුමත කිරීමේ ක්‍රියාවලිය<br><br>පුහුණු අලෙවි කණ්ඩායම සහ ශාඛා කාර්ය මණ්ඩලය හරහා ගනුදෙනුකරුගේ අවශ්‍යතාවයට අනුව ලබා දෙන සේවාව<br><br>සියලුම ගනුදෙනුකරුවන් සඳහා ඉතුරුම් ගිණුමක් විවෘත කිරීම<br>නම්‍යශීලී ආපසු ගෙවීමේ සැලැස්ම<br><br>වෙළඳපොළ පොළී අනුපාතවලට සමගාමී ඉතා තරඟකාරී පොළී අනුපාත | • අදාළ පොළී අනුපාතය අපගේ වෙබ් අඩවියෙහි සඳහන් කර ඇත.<br><br>• ආපසු ගෙවීම් අක්‍රමවත් නම් පමණක් වර්ෂිකව 3% ක අමතර දඩ පොළිය<br><br>• ලියවිලි ගාස්තු / පාරීක්ෂා කිරීමේ ගාස්තු / තක්සේරු ගාස්තු / රක්ෂණ ගාස්තු / වරිපනම් සහ බලාත්මක බදු | 1. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ණය ඉල්ලුම් පත්‍රය සමග අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ පිටපත, පදිංචිය සනාථ කිරීමේ සාක්ෂි / බිල්පත් සාක්ෂි, ණය ඇස්තමේන්තුව / ණය ලබා ගන්නා අරමුණ, ආදායම් සනාථ කිරීමේ සාක්ෂි, බද්ධ ණය ගැනුම්කරුගේ ජාතික හැඳුනුම්පතෙහි පිටපත, පාර ව්‍යා ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපත (තිබේ නම්), පසුගිය මාස හයක බැංකු ප්‍රකාශ (තිබේ නම්).<br>2. ඇපකරුවන්ගේ ප්‍රකාශය<br>3. ණය ගැනුම්කරුවන්ගේ සහ ඇපකරුවන්ගේ වත්කම් සහ වගකීම් පිළිබඳ ප්‍රකාශය.<br>4. ණය පහසුකම අනුමත වූ පසු ඇපකර ලියවිලි අත්සන් කරනු ලැබේ. | 1. ගනුදෙනුකරුගේ සහ ඇපකරුගේ ණය තොරතුරු කාර්යාංශ තත්ත්වය සමාගමට පිළිගත හැකි විය යුතුය.<br>2. අයදුම්කරු ශ්‍රී ලාංකිකයෙකු විය යුතු අතර ණය පහසුකමක් ලබා ගැනීමට නීත්‍යානුකූලව පිළිගත හැකි වයස් සීමාව තුළ සිටිය යුතු ය<br>3. අයදුම්කරු වැටුප් ලබන සේවකයෙකු හෝ ස්වයං රැකියාවක නියුතු අයෙකු විය හැක.<br>4. ගනුදෙනුකරු පැතිකඩ සමාගමේ නිර්ණායකවලට අනුකූල විය යුතු අතර, එය සමාගමේ ණය දීමේ නිර්ණායක සපුරා තිබිය යුතු ය.<br>5. ණය පහසුකම් සඳහා වන සියලු ම ඉල්ලීම් ණය ඇගයීමකට යටත් වන අතර, සියලු ම ණය අනුමත කිරීම් සමාගමේ හුදු අභිමතය පරිදි සිදු කරනු ලැබේ. |

*මෙම ලියවිල්ල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2018 අංක 1 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවේ නියමයන්ට අනුකූලව සකස් කර ඇත.*

## රන් ණය

අපගේ පුළුල් පරාසයකට අයත් මූල්‍ය සේවා හැරුණු විට, ශ්‍රී ලාංකීය වෙළෙඳපොළ තුළ අපගේ වඩාත් ජනප්‍රිය ම නිෂ්පාදන වලින් එකක් වන්නේ අපගේ "රන් ණය" සේවාවයි. ඔබගේ පහසුව සඳහා අපගේ සියලුම ශාඛා වෙතින් "LCBF රන් ණය සේවාව" සපයා දෙනු ලැබේ. මෙය අපගේ ගෞරවනීය ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ව්‍යාපාර බාධාවකින් තොරව පවත්වා ගෙන යාම සඳහා ඔවුන්ගේ කෙටි කාලීන කාරක ප්‍රාග්ධන අවශ්‍යතා ඉක්මනින් සපුරාලීමට සහාය වෙයි.

<table>
<tr><th>නිෂ්පාදනය / සේවාව</th><th>ප්‍රතිලාභ<br>දිරිදීමනා / ප්‍රවර්ධනය කිරීම</th><th>පොළිය / ගාස්තු</th><th>අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය</th><th>ප්‍රධාන අවශ්‍යතා / කොන්දේසි</th></tr>
<tr><td>රන් ණය<br><br>ඇපය ලෙස රණ්භාණ්ඩ ලබා ගෙන ගිවිස ගත් කාල සීමාවක් සඳහා ක්ෂණික ණය පහසුකම් සපයා දීම</td><td>1. වෙළඳපොළෙහි ඇති හොඳම වටිනාකම මත පදනම්ව උපරිම අත්තිකාරම් මුදල<br>2. වෙළඳපොළෙහි පවතින අනුපාතවලට සාපේක්ෂව ඉතා ආකර්ශනීය සහ තරඟකාරී පොළී අනුපාත<br>3. අය කරනු ලබන පොළියට අමතරව සැඟවුණු වියදම් හෝ ගාස්තු නැත<br>4. කඩිනම් සේවාව සහ ඔබගේ වටිනා රන් භාණ්ඩ සුරක්ෂිතව තබා ගැනීම<br>5. ඔබගේ මනාපය අනුව මාස 1, 2, 3, 6, 9 සහ 12 යන කාල සඳහා නම්‍යශීලී ආපසු ගෙවීමේ විකල්ප තිබේ<br>6. අවම ලියකියවිලි<br>7. ලිපි ලේඛන හැරීමේ කාලය අඩු කිරීමට කෙටිපණිවුඩ සේවාව<br>8. ඔබගේ බෝගයෙන් ලාභ ලැබීමෙන් පසු හෝ අස්වැන්න නෙලීමෙන් පසු ඔබට ණය ආපසු ගෙවිය හැක<br>9. අදාළ රන් භාණ්ඩය ඇපයත් ලෙස තබා ගනු ලැබේ.</td><td>1. රන් භාණ්ඩවල වටිනාකමෙහි ප්‍රතිශතයක් ලෙස අත්තිකාරම්<br>2. පොළී අනුපාත වෙළඳපොළ තත්ත්වයන් මත පදනම් වන අතර වරින් වර සංශෝධනය කරනු ලැබීමට යටත් වේ (කරුණාකර පොළී අනුපාත සඳහා අපගේ වෙබ් අඩවිය බලන්න).<br>3. අනෙකුත් ගාස්තු ද අත්තිකාරම් මුදල සහ වෙළඳපොළ තත්ත්වයන් මත පදනම් වන අතර, කලින් කලට සංශෝධනය කරනු ලැබීමට යටත් වේ.</td><td>1. වලංගු ජාතික හැඳුනුම්පත / රියදුරු බලපත්‍රය / විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කළ යුතුය.<br>2. ඇපයට තබනු ලබන රන් භාණ්ඩවල බර සහ කැරට් ප්‍රමාණය තහවුරු කර ගැනීමෙන් පසුව අත්තිකාරම් මුදල තීරණය කරනු ලැබේ.<br>3. රන් ණය ටිකට්පත / රිසිට් පත</td><td>1. වලංගු ජාතික හැඳුනුම්පතක් / වලංගු විදේශ ගමන් බලපත්‍රයක් / රියදුරු බලපත්‍රයක් හිමි වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලාංකිකයින් විය යුතු ය.<br>2. අවම ණය පහසුකම රු . 10,000/-.<br>3. ඇපයට තබනු ලබන රන් භාණ්ඩවල වටිනාකම මත පදනම් ව රන් ණය අත්තිකාරම්.<br>4. අවශ්‍ය සියලු ම ලියකියවිලි ඉදිරිපත් කිරීමෙන් පසු, සමාගමේ නියමයන් සහ කොන්දේසි අනුව මෙම පහසුකම ලබා ගත හැක</td></tr>
</table>

*මෙම ලියවිල්ල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2018 අංක 1 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවේ නියමයන්ට අනුකූලව සකස් කර ඇත.*

# කල්බදු සහ පවර් ඩ්‍රාෆ්ට්

| නිෂ්පාදනය / සේවාව | ප්‍රතිලාභ දිරිදීමනා / ප්‍රවර්ධනය කිරීම් | පොළිය / ගාස්තු | අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය | ප්‍රධාන අවශ්‍යතා / කොන්දේසි | පැමිණිලි මෙහෙයවීමේ ක්‍රියා පිළිවෙළ |
|---|---|---|---|---|---|
| කල්බදු | • අලුත්ම / අලුවැඩියා කරන ලද / ලියාපදිංචි වාහන මිලදී ගැනීම.<br>• ලියවිලි ඉදිරිපත් කිරීමේ කරදරයක් නැත.<br>• සමාගමෙහි කලින් ගිණුම් පවත්වාගෙන තිබීම අවශ්‍ය නොවේ.<br>• මනා පුහුණුව සහිත කාර්ය මණ්ඩලයක් හරහා ගනුදෙනුකරුගේ අවශ්‍යතාවයට අනුව ලබාදෙන මිත්‍රශීලී සේවාවක්.<br>• තරඟකාරී පොළී අනුපාත<br>• දිනක් ඇතුළත ණය සැකසුම් කිරීම<br>• ඔබගේ අයවැයට ගැළපෙන පරිදි පහසු ආපසු ගෙවීමේ ක්‍රම<br>• කාල සීමාව වසර 5 ක් දක්වා සැලසුම් කර ගත හැක | • ස්ථාවර පොළී අනුපාතය ( පොළීඅනුපාතය %16.5 %20.0 -අතර වෙනස් වේ).<br>• පොළී අනුපාතිකය සේවාදායකයාගේ ණය සුදුසුකම, වාහනයේ වයස සහ අලෙවිකරණ හැකියාව මත රඳා පවතියි.<br>• ලේඛන ගාස්තු ,මුද්දර ගාස්තු, රජයට ගෙවිය යුතු ගාස්තු, වැට් බද්ද (අදාළ නම්)<br>• දඩ පොළී අනුපාතය වාරික හිඟවන දින ගණන මත පදනම්ව ගණනය කරනු ලැබේ<br>• අදාළ වර්තමාන දඩ පොළී අනුපාතය මසකට %4ක් වේ. සහ දෛනිකව ගණනය කරනු ලැබේ.<br>• මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ගාස්තු ගනුදෙනුකරුගෙන් ලබා ගෙන එම දෙපාර්තමේන්තුව වෙත ගෙවනු ලැබේ. | • නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය, හැඳුනුම්පතේ / වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපත<br>• විමර්ශන ක්‍රියාවලිය<br>• භෞතික හඳුනාගැනීම<br>• ණය ඇගයීම් ක්‍රියාවලියේ විමර්ශන කටයුතු සඳහා ලේඛනමය සාක්ෂි අවශ්‍ය වේ.<br>• අදාළ පාර්ශ්ව වලින් තොරතුරු රැස් කිරීම, ආදායම් විශ්ලේෂණය, අතීත ගෙවීම් වාර්තා විශ්ලේෂණය (ණය තොරතුරු කාර්යාංශයේ / ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් ආයතනයේ ගෙවීම් ඉතිහාසය), වාහනය භෞතිකව පරීක්ෂා කරනු ලැබේ.<br>• ව්‍යාපාර ලියාපදිංචිය (ව්‍යාපාර සේවාලාභීන් සඳහා), සංස්ථාගත කිරීමේ සහතිකය (සීමිත වගකීම් සමාගම් සඳහා), 1, 18 ආකෘති පත්‍රයේ පිටපත් සහ 15, 20 ආකෘති පත්‍රයේ නවතම පිටපත් (සීමිත වගකීම් සමාගම් සඳහා), සාංගමික සංස්ථා පත්‍රය සහ සාංගමික ව්‍යවස්ථාවලිය (සීමිත වගකීම් සමාගම් සඳහා). | • පුද්ගලික සහ ආයතනික ගනුදෙනුකරුවන් සඳහා ණය පහසුකම්<br>• ශ්‍රී ලංකාවේ පදිංචිකරුවෙකු විය යුතුය<br>• අවුරුදු 18 - 60 අතර වයස් කාණ්ඩයේ විය යුතු ය.<br>• මූල්‍ය පහසුකම් ලබා ගන්නා වත්කමේ පරම හිමිකාරීත්වය ඇපය ලෙස තබනු ලැබේ<br>• අදාළ නම් පුද්ගල ඇපකරුවන්<br>• ණය තොරතුරු කාර්යාංශ වාර්තාව<br>• ජාතික හැඳුනුම්පතේ පිටපතක් | • සැමවිටම පැමිණිලිකරුගේ පුද්ගලික තොරතුරු රහසිගතව තබා ගන්නා ආකාරයට සියලුම පැමිණිලි මෙහෙයවනු ලැබේ.<br>• පැමිණිල්ලක් විසඳීමේදී අදාළ සියලු තත්වයන් විමර්ශනය කිරීමට සෑම සාධාරණ උත්සාහයක්ම දරනු ලැබේ.<br>• සාමාන්‍ය පිළිවෙතක් ලෙස, අවසාන ප්‍රතිචාරය පැමිණිලිකරුට දින 45 ක් ඇතුළත ලබා දෙනු ලැබේ. |

*මෙම ලියවිල්ල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2018 අංක 1 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවේ නියමයන්ට අනුකූලව සකස් කර ඇත.*

# "සිහින ආයෝජන" (ආයෝජන ඉතුරුම්)

| නිෂ්පාදනය / සේවාව | ප්‍රතිලාභ දිරිදීමනා / ප්‍රවර්ධනය කිරීම | පොළිය / ගාස්තු | අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය | ප්‍රධාන අවශ්‍යතා / කොන්දේසි |
|---|---|---|---|---|
| මෙය ගනුදෙනුකරුවෙකුට ගිවිස ගත් කාල සීමාවක් අවසානයේ (අවම වශයෙන් වසර 1 ක් සහ උපරිමය වසර 3 ක්) ඉලක්කගත මුදලක් සම්පූර්ණ කර ගැනීම සඳහා සෑම මසකම ස්ථාවර ඉතුරුම් මුදලක් වෙන් කිරීමට සැලසුම් කර ඇති නිෂ්පාදනයකි. | 1. ගිවිසගත් කාල සීමාව අවසානයේ ඉලක්කගත මුදලක් සම්පූර්ණ කර ගැනීම සඳහා මාසිකව ඉතිරි කිරීමට පොරොන්දුවන මුදල තැන්පත් කළ යුතුය.<br>2. පොළිය දිනපතා ගණනය කර මාසිකව ගිණුමට එකතු කරනු ලැබේ. | 1. පොළී අනුපාත වෙළඳපල තත්ත්වයන් මත පදනම් වන අතර, කලින් කලට සංශෝධනය කරනු ලැබීමට යටත් වේ.<br>2. එකඟ වූ මාසික ඉතුරුම් මුදල තැන්පත් නොකරන්නේ නම්, ස්මාර්ට් ඉතුරුම් ගිණුමක් බවට පරිවර්තනය කරනු ලැබේ.<br>3. කල්පිරීමට පෙර ගිණුම වසා දැමීමේදී, අදාළ පොළී අනුපාතය වන්නේ එල්.සී.බී. ස්මාර්ට් ඉතුරුම් ගිණුම් සඳහා ගෙවනු ලබන පොළී අනුපාතය පමණක් වේ. | 1. මාසිකව එකඟ වන මුදල සටහන් කර විධිනියෝගය නිසි පරිදි සම්පූර්ණ කළ යුතුය.<br>2. ඔබේ ගනුදෙනුකරු හඳුනාගන්න අවශ්‍යතා සම්පූර්ණ කළ යුතු වේ.<br>3. ජාතික හැඳුනුම්පතේ පිටපත හෝ ජාතික හැඳුනුම්පත් අංකය සහිත රියදුරු බලපත්‍රය හෝ විදේශ ගමන් බලපත්‍රය.<br>4. රුඳවුම් බදු ප්‍රකාශය. | වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියෙක් වීම<br><br>පාස්පොත |

*මෙම ලියවිල්ල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2018 අංක 1 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවේ නියමයන්ට අනුකූලව සකස් කර ඇත.*

## ස්මාර්ට්, රැජිණි සහ පොඩිත්තා

| නිෂ්පාදනය | අවශ්‍ය කරන ලියවිලි | සුදුසුකම් ලැබීමේ නිර්ණායක | සටහන් |
|---|---|---|---|
| ස්මාර්ට්<br>රැජිණි<br>පොඩිත්තා | <u>ස්මාර්ට්/ රැජිණි</u><br>• නිසි පරිදි සම්පූර්ණ කරන ලද එල්.සී.බී. ෆිනෑන්ස් පී.එල්.සී. ඉතුරුම් විධිනියෝගය / හඳුනා ගැනීමේ ලියවිලි (ජා.හැ.ප. / වි.ග.බ. / රි.බ.) සහ ඔබේ ගනුදෙනුකරු පිළිබඳ දැනගන්න ලේඛනය.<br>• මෑත කාලයේ උපයෝගිතා බිල්පතක පිටපත / පදිංචි ලිපිනය තහවුරු කිරීම හෝ වෙනස් කිරීම සඳහා බැංකු ප්‍රකාශන | <u>ස්මාර්ට්/ රැජිණි</u><br>• ශ්‍රී ලංකාවේ පුරවැසියන් / පදිංචිකරුවන් / ද්විත්ව පුරවැසියන් වීම සහ වයස අවුදරුදු 18 ට වැඩිවීම | <u>ඉතුරුම් ගිණුමක් විවෘත කර පවත්වාගෙන යාමේදී සැලකිල්ලට ගත යුතු කරුණු</u><br>• මූලික තැන්පතුව රු. 500/-<br>• පොළිය උපයා ගැනීම සඳහා රු. 500 ක අවම ශේෂයක් පවත්වා ගත යුතුය<br>• පොළිය දෛනික පදනමින් ගණනය කරනු ලබන අතර මාසය අවසානයේ ගිණුමට බැර කරනු ලැබේ.<br>• ගිණුම් හිමියාට පමණක් ඕනෑම ශාඛාවකින් මුදල් ආපසු ගැනීමට අවසර ඇත. තුන්වන පාර්ශ්වයකට මුදල් ආපසු ගැනීමට අවසර දෙනු නොලැබේ.<br>• ඉල්ලීම මත අගය එකතු කළ සේවාවන් සපයනු ලැබේ.<br>• ඉතිරිකිරීමේ ගිණුමට චෙක්පත් තැන්පත් කිරීම කළමනාකාරිත්වයේ හුදු අභිමතය පරිදි සිදු කරනු ලැබේ.<br>• ගනුදෙනුකරු තැන්පතු / ආපසු ගැනීම් සහ ශේෂයන් සම්බන්ධ සටහන් පරීක්ෂා කර බැලිය යුතුය.<br>• පාස්පොත හෝ ගිණුම් ප්‍රකාශ ගනුදෙනුකරුගේ ඉල්ලීම මත නිකුත් කරනු ලැබේ.<br>• බාලවයස්කරුට වයස අවුරුදු 18 සම්පූර්ණ වන තුරු බාලයස්කාර ගිණුම් වලින් මුදල් ආපසු ගැනීමට ඉඩ දෙනු නොලැබේ.<br>• පළමු තැන්පතුවේ දිනයේ සිට මාස 60 ක් සම්පූර්ණ වූ පසු දෙමව්පියන්ගේ / භාරකරුගේ ඉල්ලීම පරිදි බාලවයස්කාර ගිණුමක් වෙනත් බැංකුවකට හෝ මූල්‍ය සමාගමකට මාරු කළ හැක.<br>• LCB ෆිනෑන්ස් සමාගමට පිළිගත හැකි සාධාරණ හේතුවක් මත බාල වයස්කරුගේ වෛද්‍ය සහ අධ්‍යාපන අවශ්‍යතා වැනි සාධාරණ හේතුවක් සඳහා මත මුදල් ආපසු ගැනීමට අවසර ලැබේ.<br>• පාස්පොත නැතිවූ / හානිවූ අවස්ථාවක වගකීමෙන් නිදහස් කිරීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය. |
| | <u>පොඩිත්තා</u><br>• විධිනියෝගය / උප්පැන්න සහතිකය<br>දෙමව්පියන්ගේ / භාරකරුගේ හඳුනා ගැනීමේ ලියවිලි (ජා.හැ.ප. / වි.ග.බ. / රි.බ.) | <u>පොඩිත්තා</u><br>වයස අවුරුදු 18 ට අඩු ළමයින් සඳහා **පොඩිත්තා** ගිණුම විවෘත කරනු ලබන අතර, දෙමව්පියන් / භාරකරු අත්සන්කරු වේ | |

**මෙම ලියවිල්ල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2018 අංක 1 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවේ නියමයන්ට අනුකූලව සකස් කර ඇත.**

## ස්ථාවර තැන්පතු

| | |
|---|---|
| ප්‍රධාන ලක්ෂණ සහ මූල්‍ය ගනුදෙනුකරුවන්ට තිබෙන ප්‍රතිලාභ | • පොළී අනුපාත මාස 1 සිට මාස 60 දක්වා වන කාල පරිච්ඡේද මත පදනම් ව..<br>• ගනුදෙනුකරුගේ තේරීම අනුව කල්පිරීමේදී හෝ මාසිකව පොළිය ගෙවනු ලැබේ.<br>• ස්ථාවර තැන්පතුවේ වටිනාකමෙන් 80% ක් දක්වා (පොළිය මාසිකව ගෙවනු ලබන්නේ නම්) සහ 85% ක් දක්වා (කල්පිරීමේදී පොළිය ගෙවනු ලබන්නේ නම්) ණය පහසුකම් ලබා ගැනීමේ හැකියාව. |
| අවම ශේෂ අවශ්‍යතාවය | • රු. 10,000/- |
| ආරම්භක ගාස්තුව | • විවෘත කිරීමේ ගාස්තුවක් නැත. |
| පවත්වාගෙන යාමේ ගාස්තුව | • පවත්වාගෙන යාමේ ගාස්තු නැත. |
| තැන්පතු රක්ෂණ ආවරණය | • තැන්පත් කළ මුදල මත පදනම්ව උපරිමය රු. 1,100,000/-. |
| ගනුදෙනුකරුවන් විසින් ගිණුම විවෘත කිරීම / ගිණුම වසා දැමීම / මුදල් මාරු කිරීම පිළිබඳ සීමා | • වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලාංකාවේ පදිංචිකරුවන්ට ස්ථාවර තැන්පතු ගිණුම් විවෘත කිරීමට අවසර ඇත. කෙසේ වෙතත්, බද්ධ තැන්පතුකරුවෙකු ලෙස භාරකරුවෙකු ඇති විට බාලවයස්කාර ස්ථාවර තැන්පතු භාරගනු ලැබේ<br>• තැන්පතු හිමියාගේ වයස අවුරුදු 18 ට අඩු නම්, එම බාලවයස්කාර ගිණුම් හිමියාගේ වයස අවුරුදු 18 වන තෙක් තැන්පතු ආපසු ලබාගත නොහැක.<br>• තැන්පත්කරු විදේශගතව සිටින්නේ නම්, ස්ථාවර තැන්පතුව සම්බන්ධයෙන් ලබා දී ඇති මූලික උපදෙස්වල කිසියම් වෙනසක් සිදු කිරීම සඳහා ඇටෝර්නි බලපත්‍රයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.<br>• වලංගු ජාතික හැඳුනුම්පතක් / ගමන්   ලාංකිකයන්නොමැති ශ්‍රී  යක්බලපත්‍ර<br>• ශ්‍රී ලංකාවේ නේවාසික වීසා නොමැති විදේශිකයන්<br>• කල්පිරීමට පෙර මුදල් ආපසු ගැනීම් /   ලංකා ළිය ශ්‍රීකලින් මුදල් ආපසු ගැනීම් සඳහා අදාළ පො මහ බැංකුවේ 2019 අංක 1 දරන නියෝග වලට අනුව තීරණය කරනු ලැබේ |
| *බලය නොපවරන ලද හෝ වැරදීමකින් සිදුකරන ලද ගනුදෙනු සම්බන්ධ කාර්යපටිපාටිය* | • අභ්‍යන්තර වංචාවක් හේතුවෙන් යම් අලාභයක් සිදු වුව හොත් තැන්පත්කරුට ගෙවිය යුතු ස්ථාවර තැන්පතු මුදල සමග පොළී මුදල ගෙවනු ලැබේ. |

**මෙම ලියවිල්ල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2018 අංක 1 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවේ නියමයන්ට අනුකූලව සකස් කර ඇත.**

## පැමිණිලි මෙහෙයවීමේ කාර්ය පටිපාටිය

ගනුදෙනුකරුවන්ට පහත සඳහන් ක්‍රම හරහා පැමිණිලි කළ හැක:

ඩබ්ලිව්. ඩී. මංගල හසිත වැවිට මහතා
අනුකූලතා ප්‍රධානී
ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් පී.එල්.සී.
අංක 76, එස්. ද එස්. ජයසිංහ මාවත, කොහුවල
දුරකථන: 011 282 5404 / 05 / 06 (දිගුව - 207)
ජංගම දුරකථනය - 076 098 8086
ඊමේල් - mangala@lcbfinance.lk

**ශ්‍රී ලංකාවේ මූල්‍ය ඔම්බුඩ්ස්මන්**

මූල්‍ය ඔම්බුඩ්ස්මන්
මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය,
143 ඒ, වජිර පාර,
කොළඹ 05.
දුරකථනය: +94 11 259 5624
ටෙලිෆැක්ස්: +94 11 259 5625
ඊමේල්: fosril@sltnet.lk
වෙබ් අඩවිය :www.financialombudsman.lk